සැ. යු.- 2012.06.08 දින පළ වූ අංක 1,762 දරන ගැසට් පත්‍රයේ I- III කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,763 - 2012 ජුනි මස 15 වැනි සිකුරාදා - 2012.06.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1008 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජුනි මස 22 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජුනි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

## දකුණු පළාතේ පළාත් සභාව

2012 අංක 02 දරන දකුණු පළාත් ආයුර්වේද හා දේශීය වෛද්‍ය සේවා (සංශෝධිත) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් 2012.02.28 වැනි දින සම්මත කරන ලදුව 2012.03.14 වැනි දින ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කොට ඇති ඉහත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පළ කරමි.

ෂාන් විජයලාල් ද සිල්වා,
ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, ප්‍රවාහන,
ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය,
දකුණු පළාත.

2012 මැයි මස 10 වැනි දින,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

දකුණු පළාත් සභාව සඳහා ආයුර්වේද සහ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ද පළාත් ආයුර්වේද කොමසාරිස්වරයෙකු පත් කිරීම සඳහා ද, ආයුර්වේද සේවා නියාමන මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද, ආයුර්වේද ආයතන පිහිටුවීම සඳහා ද, දකුණු පළාත තුළ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සඳහා ද, සහ ඊට අදාළ හා ආනුෂංගික වූ කාරණා සඳහා විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන 1961 අංක 31 දරන ආයුර්වේද පනතට අනනුකූල වේ.

දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක කිරීමේ දිනය.

1. මෙම ප්‍රඥප්තිය 2012 අංක 02 දරන දකුණු පළාත් ආයුර්වේද සහ දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් තම අනුමැතිය දෙන ලද දින සිට බල පැවැත්විය යුතු ය.

### 1 වැනි කොටස

### *දකුණු පළාත් ආයුර්වේද සහ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවක් පිහිටුවීම*

දකුණු පළාත් ආයුර්වේද සහ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම.

2. (මෙම ප්‍රඥප්තියේ මින්මතු දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන) ආයුර්වේද සහ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන දෙපාර්තමේන්තුවක් මේ ප්‍රඥප්තියේ 4 වැනි වගන්තියේ නිශ්චිතව සඳහන් කාර්ය කරගෙන යාම සඳහා පිහිටුවිය යුතු ය.

පළාත් ආයුර්වේද සහ දේශීය වෛද්‍ය කොමසාරිස්වරයා පත් කිරීම.

3. (1) දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විය යුතු (මේ ප්‍රඥප්තියේ මින්මතු පළාත් කොමසාරිස් යනුවෙන් හඳුන්වනු ලබන) තැනැත්තෙක් පළාත් ආයුර්වේද සහ දේශීය වෛද්‍ය කොමසාරිස් වශයෙන් හෝ ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා හෝ පත් කළ යුතු ය.

(2) දෙපාර්තමේන්තුවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරයෙකු සහ ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක වෙනුවෙන් සහකාර කොමසාරිස්වරුන් සහ නිලධරයන් සංඛ්‍යාවක් පත් කළ හැකි ය.

(3) පළාත් කොමසාරිස්වරයා විසින් තමන්ගේ බලතල කිසිවක් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරුන් වෙත පැවරීම කළ හැකි වන්නේ ය.

දෙපාර්තමේන්තුවේ පරමාර්ථ.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන පරමාර්ථ ඉටුකිරීම දෙපාර්තමේන්තුවේ කාර්ය වන්නේ ය. එනම් :-

(අ) මහජනයාගේ සෞඛ්‍ය සුරැකීමේ සහ වැඩිදියුණුකිරීමේ අදහසින් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දකුණු පළාත තුළ ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම ;

(ආ) දකුණු පළාත් සභාවේ ආදායම් මාර්ගයක් ලෙස ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) මේ ප්‍රඥප්තියේ සඳහන් කරනු ලබන ආයුර්වේද ආයතන සමස්තයක් වශයෙන් කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම.

## II වැනි කොටස

*ආයුර්වේද ආයතන*

ආයුර්වේද ආයතන ලියාපදිංචි කිරීම.

5. (1) කිසිදු තැනැත්තකු විසින් -

පළාත් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීමක් මගින් නියම කරනු ලබන දිනක දී හෝ ඊට පසු -

(අ) පළාත් කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක් මගින්, ආයුර්වේද ආයතනයන් පවත්වාගෙනයාම සඳහා එකී තැනැත්තාට බලය දී ඇත්තේ නම් මිස ; සහ

(ආ) යම් පරිශ්‍රයක්, හඳුනාගත් ආයුර්වේද ආයතනයක් ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් පරිශ්‍රයක් ලෙස පළාත් ආයුර්වේද කොමසාරිස් වෙත තත්කාලයේ ලියාපදිංචි කොට ඇත්තේ නම් මිස,

කිසිදු තැනැත්තකු විසින් කිසිම ආයුර්වේද ආයතනයක් පවත්වාගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම හෝ නොකළ යුතු ය.

(2) (1) වැනි උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයක දී වරදකරු කිරීමේ දී රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට හෝ තෙමසකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

ලියාපදිංචි කිරීමේ පටිපාටිය.

6. (1) (අ) ආයුර්වේද ආයතනයක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම නියමිත ආකෘතියෙන්, නියමිත ගාස්තුව සමග සහ නියමිත වෙනත් සියලු ලේඛන සමග පළාත් කොමසාරිස්වරයාට ඉදිරිපත් කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් කරනු ලබන ගාස්තුව ආපසු නොගෙවනු ලැබිය යුතු ය.

(2) පළාත් කොමසාරිස්වරයා විසින්, (1) වැනි උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රය ලැබීමෙන් පසු, මේ ප්‍රඥප්තියේ 10 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලබන ආයුර්වේද සේවා නියාමන මණ්ඩලයේ නිරීක්ෂණ ඇතුළත් නියමිත ආකෘතියෙන් වූ වාර්තාවක් සපයන ලෙස එකී මණ්ඩලයෙන්, ඉල්ලීමක් කළ යුතු ය.

(3) (2) වැනි උපවගන්තියේ සඳහන් පළාත් කොමසාරිස්වරයාගේ එකී ඉල්ලීම ලැබීමේ දිනයේ සිට දින විසි එකක් ඇතුළත නියාමන මණ්ඩලය විසින් නිරීක්ෂණ වාර්තාවක් පළාත් කොමසාරිස්වරයාට ලබා දිය යුතු ය.

(4) පළාත් කොමසාරිස්වරයා හෝ ඔහුගේ ලිඛිත අවසරය ලැබූ තැනැත්තකු හෝ, නියාමන මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ, නියාමන මණ්ඩලයේ ලිඛිත අවසරය ලැබූ යම් තැනැත්තකු හෝ විසින්, මේ වගන්තියේ කාර්යය සඳහා පූර්ව දැනුම්දීමක් ඇතිව හෝ එසේ නොමැතිව, සියලු සාධාරණ වේලාවන් තුළ, හඳුනාගත් ආයුර්වේද ආයතනයක් ලෙස ලියාපදිංචිවීමට අපේක්ෂා කරනු ලබන පරිශ්‍රයකට ඇතුළුවීම සහ එකී පරිශ්‍රය පරීක්ෂා කිරීම ද, ඉල්ලුම්කරු හෝ එහි සිටින ඕනෑම තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම ද කරනු ලැබිය හැකි ය.

(5) පළාත් කොමසාරිස්වරයා විසින්, නියාමන මණ්ඩලයේ වාර්තාව සහ අනික් සියලු අදාළ සාධක සලකා බැලීමෙන් පසු-

(අ) ආයුර්වේද ආයතනය ලියාපදිංචි කොට, එකී ඉල්ලුම්කරු එකී ආයතනය කළමනාකරණය කිරීමට සහ පරිපාලනය කිරීමට වගකිව යුතු තැනැත්තා වශයෙන් නම් කරමින්, ඉල්ලුම්කරුට ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීමට සහ එකී පරිශ්‍රය එකී ආයුර්වේද ආයතනය පවත්වාගෙන යා යුතු පරිශ්‍රය ලෙස ලියාපදිංචි කිරීමට ; හෝ

(ආ) ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කොට එකී ප්‍රතික්ෂේප කිරීමට හේතුව ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දීමට,

කටයුතු කළ යුතු ය.

(6) (අ) ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ පළාත් කොමසාරිස්වරයාගේ තීරණය සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එකී තීරණය තමන්ට දැනුම්දෙනු ලැබූ දිනයෙන් දින දාහතරක් ඇතුළත එකී තීරණයට විරුද්ධව පළාත් අමාත්‍යවරයාට අභියාචනය කළ හැකි ය. ;

(ආ) අමාත්‍යවරයා විසින් එකී අභියාචනය තමන්ට ලැබීමෙන් මාසයක් ඇතුළත තම තීරණය ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය.

(7) (අ) මේ වගන්තියේ සඳහන් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකය වර්ෂයක් පාසා අලුත් කළ යුතු ය.

(ආ) වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුව අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කළ හැකි ය.

ආයුර්වේද ආයතන.

7. මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ආයුර්වේද ආයතන යන්නට -

(අ) ආයුර්වේද රෝහලක් ;
(ආ) ආයුර්වේද ප්‍රතිකර්ම මධ්‍යස්ථානයක් හෝ බෙහෙත් ශාලාවක් ;
(ඇ) ආයුර්වේදී විවේක නිකේතනයක් ;
(ඈ) ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් ;
(ඉ) ආයුර්වේද ඔසුහලක් ; සහ
(ඊ) ආයුර්වේද ඖෂධ ශාක වත්තක් හෝ ඔසු උයනක්

ඇතුළත් වේ.

ආයුර්වේද ආයතන සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ බලතල හා කර්තව්‍ය.

8. (1) පළාත් කොමසාරිස්වරයා විසින් -

(අ) දකුණු පළාත තුළ ආයුර්වේද ආයතන පිහිටුවා පවත්වාගෙන යාම හෝ පිහිටුවා පවත්වාගෙන යාමට සැලැස්වීම ;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන ආයුර්වේද ආයතනවලට අදාළ ලේඛන, දත්ත සහ සංඛ්‍යාත විධිමත් ලෙස පවත්වාගෙන යාම සහ යථාවත් කිරීම සහ ඒවාට අදාළ ලියකියවිලි සූක්ෂම ලෙස පිරික්සීම සහතික කිරීම ;

(ඇ) සෑම ආයුර්වේද ආයතනයක් විසින්ම පවත්වාගෙන යා යුතු නියමිත ප්‍රමිති නිශ්චිතව සඳහන් කිරීම ;

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන ආයුර්වේද ආයතන, මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව කළමනාකරණය කරනු ලබන්නේ ද සහ පවත්වාගෙන යනු ලබන්නේ ද යන්න නිශ්චය කිරීම

කළ යුතු වේ.

(2) මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී පළාත් කොමසාරිස්වරයා විසින්, පළාත් අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත්කරනු ලබන පරිදි වූ යම් සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

නියෝග.

9. පළාත් අමාත්‍යවරයා විසින්, පහත දක්වා ඇති සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය. එනම් -

(අ) ආයුර්වේද ආයතනයක් ලියාපදිංචි කරනු ලැබීමට අපේක්ෂිත පරිශ්‍රයක් තුළ පවත්වාගෙන යා යුතු ප්‍රමිතීන් ;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන ආයුර්වේද ආයතනයක් තුළ පිළිපැදිය යුතු නියමන් සහ කොන්දේසි, එකී ආයතනය තුළ පවත්වාගෙන යා යුතු ප්‍රමිතීන් සහ එකී ආයතන නිසි අයුරින් නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම ;

(ඇ) ප්‍රඥප්තිය යටතේ ඉදිරිපත් කළ යුතු ඉල්ලුම්පත්‍රවල ආකෘති සහ ඒවායේ ඇතුළත් විය යුතු විස්තර ;

(ඈ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආයතනයක් විසින් තබාගත යුතු සහ පවත්වාගෙන යා යුතු වාර්තා සහ පොත් ;

(ඉ) මේ ප්‍රඥප්තියේ මේ කොටස යටතේ කොමසාරිස්වරයා විසින් තබාගත යුතු සහ පවත්වාගෙන යා යුතු රෙජිස්ටරවල ඇතුළත් විය යුතු තොරතුරු ;

(ඊ) ආයුර්වේද ආයතන සම්බන්ධයෙන් කලින් කල ඉදිරිපත් කළ යුතු වාරවාර්තා ද, එකී ආයතනවලට ඇතුළත් කරනු ලැබූ හෝ එකී ආයතනවලින් ප්‍රතිකාර ගනු ලැබූ තැනැත්තන්ගේ සංඛ්‍යාව සහ ඔවුන්ගේ විස්තර ද ඒවායේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ද සමග එකී වාර්තාවල ඇතුළත් විය යුතු තොරතුරු ;

(උ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආයතන තුළට ඇතුළුවීමට සහ ඒවා පරීක්ෂා කිරීමට අදාළ බලතල ;

(ඌ) ලියාපදිංචි වූ අභ්‍යන්තර රෝගීන් වශයෙන් හෝ බාහිර රෝගීන් වශයෙන් යම් හඳුනාගත් ආයුර්වේද ආයතනයකින් සේවා ලබාගන්නා තැනැත්තන්ගෙන් අයකර ගනු ලබන ගාස්තු ;

(එ) අවස්ථානුකූලව ආයුර්වේදයේ ප්‍රවර්ධනයට අවශ්‍ය යැයි පළාත් කොමසාරිස්වරයා තීරණය කරනු ලබන කාරණයක්.

## III වැනි කොටස

### *ආයුර්වේද සේවා නියාමන මණ්ඩලය*

10. අමාත්‍යවරයා විසින්, (මෙහි මින් මතු "නියාමන මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) දකුණු පළාත් ආයුර්වේද සේවා නියාමන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් ස්ථාපිත කරනු ලැබිය යුතු ය. දකුණු පළාත් ආයුර්වේද සේවා නියාමන මණ්ඩලය ස්ථාපිත කිරීම.

11. (1) නියාමන මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය. එනම් - නියාමන මණ්ඩලයේ සංයුතිය.

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු පළාත් කොමසාරිස්වරයා ;

(ආ) ආයුර්වේද විෂයය පවරාදෙනු ලැබූ පළාත් අමාත්‍යවරයාගේ පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙකු ;

(ඇ) පොලිස්පතිවරයා විසින් නම් කළ යුතු තත්කාලයේ දකුණු පළාතේ කටයුතු කරනු ලබන නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු;

(ඈ) පොලිස්පතිවරයා විසින් නම් කළ යුතු, තත්කාලයේ දකුණු පළාතේ කටයුතු කරනු ලබන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු ;

(ඉ) දකුණු පළාත් සභාවේ ප්‍රධාන නීති නිලධාරිවරයා ;

(ඊ) 2005 අංක 38 දරන සංචාරක පනත මගින් පිහිටුවනු ලැබූ සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එකී අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු ;

(උ) 1894 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඌ) පළාත් අමාත්‍යවරයා විසින් නම් කළ යුතු ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයින් ලෙස අවුරුදු දහයකට වැඩි පළපුරුද්දක් ඇති සහ දකුණු පළාතේ වෘත්තියේ යෙදී සිටින ලියාපදිංචි ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් තිදෙනෙකු ; සහ

(එ) ප්‍රධාන අමාත්‍යවරයා විසින් නම් කළ යුතු, දකුණු පළාතේ වෘත්තියේ යෙදී සිටින, අවුරුදු පහළොවකට වැඩි වෘත්තීමය පළපුරුද්දක් සහිත නීතිඥවරයකු.

(2) (1) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) ඡේදවල සඳහන් කරනු ලබන සාමාජිකයින් නිල බලයෙන් පත්කරනු ලබන සාමාජිකයින් ලෙස මින් මතු මේ ප්‍රඥප්තියේ සඳහන් කරනු ලබන අතර (ඌ) සහ (එ) ඡේදවල සඳහන් කරනු ලබන සාමාජිකයින්, පත්කළ සාමාජිකයින් ලෙස මින්මතු මේ ප්‍රඥප්තියේ සඳහන් කරනු ලැබේ.

12. (1) (අ) පළාත් අමාත්‍යවරයා විසින්, (මෙහි මින් මතු "රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් හඳුන්වනු ලබන) වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තකු නියාමන මණ්ඩලයේ රෙජිස්ට්‍රාර්වරයා ලෙස පත් කළ යුතු අතර, ඔහු නියාමන මණ්ඩලයේ ප්‍රධාන පරිපාලන නිලධරයා විය යුතු ය. රෙජිස්ට්‍රාර්වරයා සහ වෙනත් කාර්ය මණ්ඩල පත්කිරීම.

(ආ) රෙජිස්ට්‍රාර්වරයා නියාමන මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීමෙහි ලා වගකිව යුතු ය ;

(ඇ) රෙජිස්ට්‍රාර්වරයාට, නියාමන මණ්ඩලයේ යම් රැස්වීම්වල දී පැමිණ සිටීමට සහ අදහස් ප්‍රකාශ කිරීමට හිමිකම තිබෙන අතර, ඡන්දය ප්‍රකාශ කිරීමට ඔහුට අයිතියක් නොමැති විය යුතු ය ;

(ඈ) රෙජිස්ට්‍රාර්වරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත් (i) වැනි උපවගන්තිය යටතේ පත්කිරීමක් කරන තෙක්, පළාත් අමාත්‍යවරයා විසින්, නියාමන මණ්ඩලයේ පත්කළ සාමාජිකයකු එකී පුරප්පාඩුව සඳහා පත් කිරීම කළ යුතු ය ;

(2) (අ) නියාමන මණ්ඩලය විසින් පළාත් අමාත්‍යවරයා විමසා, පළාත් අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවය මත නියාමන මණ්ඩලයේ කර්තව්‍ය කරගෙනයාම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් සහ සේවකයින් පත්කළ හැකි ය ;

(ආ) නියාමන මණ්ඩලයේ නිලධරයන් හා සේවකයින්හට පළාත් අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර පළාත් අමාත්‍යාංශයේ පළාත් අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය;

නියාමන මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය.

13. නියාමන මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම කළ යුතු ය-

(අ) ආයුර්වේද ආයතන තුළ රෝගීන් රැකබලාගැනීම සඳහා වන ගුණාත්මකභාවය සාක්ෂාත් කිරීමේ වැඩ සටහන් සම්පාදනය කිරීම හා ඒවා නියාමනය කිරීම ;

(ආ) අදාළ සෞඛ්‍ය තොරතුරු සහ සංඛ්‍යානමය තොරතුරු එක්රැස් කිරීම සහ පළකිරීම ;

(ඇ) ආයුර්වේද ආයතන විසින් පිරිනමනු ලබන පහසුකම්වලට අනුකූලව එකී ආයතන ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ;

(ඈ) පළාත් කොමසාරිස්වරයා විසින් උපදෙස් හෝ සහාය ඉල්ලා සිටිනු ලබන විටෙක, ඔහුට උපදෙස් ලබා දීම හෝ සහාය ලබාදීම ;

(ඉ) මේ ප්‍රඥප්තිය යටතේ කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීමේ දී අවශ්‍යවන්නා වූ විද්‍යාත්මක, තාක්ෂණික සහ විශේෂඥ සහාය, අවශ්‍ය අවස්ථාවන්හි දී ලබා ගැනීම ; සහ

(ඊ) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආයතන මේ ප්‍රඥප්තිය මගින් සලසනු ලබන ප්‍රමිතීන්ට සහ පිරිවිතරවලට අනුකූලව ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම.

නියාමන මණ්ඩලයේ රැස්වීම සඳහා ගණපූරණය.

14. නියාමන මණ්ඩලයේ යම් රැස්වීම් සඳහා ගණපූරණය සාමාජිකයින් හය දෙනෙකු වේ.

නියාමන මණ්ඩලය විසින් තම කාර්ය සහ කර්තව්‍ය පැවරීම.

15. නියාමන මණ්ඩලය විසින් එසේ කිරීම අවශ්‍ය යැයි සලකනු ලබන විටෙක, මේ ප්‍රඥප්තිය යටතේ වූ තම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම නියාමන මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට හෝ, නියාමන මණ්ඩලය විසින් පත්කරනු ලබන යම් කමිටුවකට හෝ පැවරීම කළ හැකි අතර, එකී සාමාජිකයා හෝ එකී කමිටුව හෝ විසින් එකී කාර්ය සහ කර්තව්‍ය නියාමන මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානය යටතේ ඉටුකිරීම කළ යුතු ය.

ඇතුළුවීමේ සහ පරීක්ෂා කිරීමේ බලතල.

16. (1) නියාමන මණ්ඩලයේ සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ ලිඛිත අවසරය ලැබූ යම් තැනැත්තකු හෝ විසින්, මේ ප්‍රඥප්තියේ විධිවිධාන පිළිපදිනු ලබන බව සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා, දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ කවර හෝ වේලාවක පූර්ව දැනුම්දීමක් නොමැතිව යම් පරිශ්‍රයකට ඇතුළු වී-

(අ) එකී පරිශ්‍රය පරීක්ෂා කිරීම ;

(ආ) එහි සිටින යම් තැනැත්තකු හෝ රෝගියෙකුගෙන් ප්‍රශ්න කිරීම ;

(ඇ) එය තුළ පවත්වාගෙන යන යම් රෙජිස්ටර හෝ වාර්තා හෝ පරීක්ෂා කිරීම සහ එකී රෙජිස්ටරයේ හෝ වාර්තාවේ පිටපත් ගැනීම ; සහ

(ඈ) එකී පරිශ්‍රය භාරව සිටින යම් තැනැත්තකුට මේ ප්‍රඥප්තියේ විධිවිධාන හා අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය විය හැකි උචිත පියවර ගැනීමට නියම කිරීම,

කළ හැකි වන්නේ ය.

(2) ආයුර්වේද ආයතනය භාරව සිටින තැනැත්තා සහ එකී ආයතනය තුළ සිටින සෑම තැනැත්තකුම විසින්, (1) වැනි උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති නිලධරයන් හට සියලු සාධාරණ සහාය දීම කළ යුතු අතර ඔවුන් විසින් ඉල්ලා සිටිය හැකි වාර්තාවල පිටපත් හෝ තොරතුරු ලබාදීම ද කළ යුතු ය.

නියාමන මණ්ඩල විසින් පොලිස් සහය ලබාගැනීම.

17. (1) මේ ප්‍රඥප්තිය යටතේ කාර්ය සහ කර්තව්‍ය කරගෙන යාමේ කාර්ය සඳහා නියාමන මණ්ඩලය විසින් පොලීසියේ සහාය ඉල්ලා සිටිය හැකි අතර එකී සහාය ලබාදීම පොලීසියේ කාර්යභාරය විය යුතු ය.

(2) සභාපතිවරයා හෝ 16 වැනි වගන්තියේ බලතල යටතේ කටයුතු කරනු ලබන යම් අවසරලත් තැනැත්තකු හෝ විසින්, මේ ප්‍රඥප්තියේ විධිවිධාන බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් පිළිබඳව වහා පොලීසියට දැනුම් දිය යුතු අතර, මේ ප්‍රඥප්තියේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකුට විරුද්ධව පොලීසිය විසින් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු පැවරීම කළ හැකි ය.

පීඩාකාරී හැසිරීම ආදිය වරදක් බව.

18. (1) පීඩාකාරීව හෝ ප්‍රමාණය ඉක්මවමින් හෝ ප්‍රචණ්ඩත්වයට යොමුවෙමින් 16 වැනි වගන්තියේ බලය යටතේ ක්‍රියාකරනු ලබන යම් අවසරලත් නිලධරයකු හෝ සේවකයකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කිරීමේ දී ඒ තැනැත්තා රුපියල් පනස්දහස නොඉක්මවන දඩයකට, හෝ මාස 03 ක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩයට හෝ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ දෙනු ලැබූ යම් සාමාන්‍ය හෝ විශේෂ බලයක් යටතේ ක්‍රියාකරන යම් අවසරලත් නිලධරයකුට යම් සාධාරණ හෝ යුක්ති සහගත හේතුවක් නොමැතිව අවනත නොවන හෝ බාධාකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

19. මේ ප්‍රඥප්තියේ උපලේඛනයේ විධිවිධාන පහත දැක්වෙන කාරණාවලට, එනම් - නියාමන මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාමට අදාළ වෙනත් කාරණා.

(අ) නියාමන මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ආ) නියාමන මණ්ඩලයේ පත්කළ සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම ;

(ඇ) නියාමන මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම ;

(ඈ) නියාමන මණ්ඩලයේ රැස්වීම් නිසි ලෙස පවත්වාගෙන යාම ;

(ඉ) නියාමන මණ්ඩලයේ තීරණ වලංගුභාවයට පත් කිරීම ;

(ඊ) නියාමන මණ්ඩලයේ මුද්‍රාව ;

(උ) නියාමන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීමට නුසුදුසුකම් ;

(ඌ) නියාමන මණ්ඩලයේ බලතල පැවරීම ;

(එ) නියාමන මණ්ඩලයේ සාමාජිකයන්හට පාරිශ්‍රමික ගෙවීම ;

(ඒ) මේ පනත යටතේ හෝ නියාමන මණ්ඩලයේ විධානය මත හෝ ගනු ලබන ක්‍රියාමාර්ග ආරක්ෂා කිරීම ;

(ඔ) නියාමන මණ්ඩලයට විරුද්ධව නිකුත් කරනු ලබන රිට් ආඥා ; සහ

(ඕ) නියාමන මණ්ඩලය උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

යන කාරණාවලට අදාළ විය යුතු ය.

## IV වැනි කොටස

### *ආයුර්වේද සේවා නියුක්තිකයන්*

20. (1) පළාත් අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින් එකී කාරණය සඳහා නියම කරනු ලබන දිනයක දී හෝ ඊට පසු, කිසිදු තැනැත්තෙකු, එකී තැනැත්තා නියාමන මණ්ඩලය වෙත තත්කාලයේ ලියාපදිංචිව ඇත්නම් මිස, දකුණු පළාත තුළ, ආයුර්වේද සේවා නියුක්තිකයකු ලෙස කටයුතු නොකළ යුතුය. ආයුර්වේද සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම.

(2) (1) වැනි උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. ආයුර්වේද සේවා නියුක්තිකයන්.

21. මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ආයුර්වේද සේවා නියුක්තිකයන් යන්නට -

(අ) ආයුර්වේදී ඖෂධ නිකුත්කරන්නන් ;

(ආ) ආයුර්වේදී උපස්ථායකවරුන් ; සහ

(ඇ) ආයුර්වේදී සම්බාහකවරුන්,

ඇතුළත් වේ.

22. (1) ආයුර්වේද සේවා නියුක්තිකයකු ලෙස අදාළ රෙජිස්ටරයේ ලියාපදිංචිවීම සඳහා වූ සෑම ඉල්ලුම්කිරීමක්ම ලිඛිතව සහ නියමිත ආකාරයට, නියාමන මණ්ඩලයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එකී ඉල්ලුම් පත, නියමිත ලේඛන සමග ඉදිරිපත් කළ යුතු ය. ආයුර්වේද සේවා නියුක්තිකයකු ලෙස ලියාපදිංචිවීමට ඉල්ලුම් කිරීම.

(2) ආයුර්වේද සේවා නියුක්තිකයකු ලෙස කරනු ලැබූ යම් ලියාපදිංචිවීමක් නියාමන මණ්ඩලය විසින් පූර්වයේ අවලංගු කරනු ලැබූ යම් තැනැත්තකුට, ලියාපදිංචිවීම සඳහා නැවත ඉල්ලුම් කළ හැකි අතර නියාමන මණ්ඩලය විසින් එකී ඉල්ලුම් කිරීම මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව පරීක්ෂාකොට සුදුස්සක් කරනු ලැබිය යුතුය.

රෙජිස්ට්‍රාර්වරයා.

23. (1) නියාමන මණ්ඩලය විසින් පහත දැක්වෙන ආයුර්වේද සේවා නියුක්තිකයින්, එනම් -

(i) ආයුර්වේදී ඖෂධ නිකුත් කරන්නන් ;

(ii) ආයුර්වේදී උපස්ථායකවරුන් ; සහ

(iii) ආයුර්වේදී සම්බාහකවරුන්,

ලියාපදිංචි කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් වූ රෙජිස්ටර පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වැනි උපවගන්තියේ සඳහන් රෙජිස්ටරයක් නිසියාකාරව තබාගැනීම සහ පවත්වාගෙන යාම නියාමන මණ්ඩලයේ රෙජිස්ට්‍රාර්වරයාගේ වගකීම විය යුතුය.

(3) 24 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයා විසින් නියාමන මණ්ඩලය විමසා, (1) වැනි උපවගන්තියේ සඳහන් කරනු ලැබූ එක් එක් වර්ගයේ ආයුර්වේද සේවා නියුක්තිකයකු ලෙස ලියාපදිංචිවීම සඳහා යම් තැනැත්තකුට අවශ්‍යවන්නා වූ සුදුසුකම් නියම කරමින් නියෝග සෑදිය හැකිය.

ආයුර්වේද සේවා නියුක්තිකයකු ලෙස ලියාපදිංචි වීමට අවශ්‍ය සුදුසුකම්

24. කිසිම තැනැත්තකු, එකී තැනැත්තා,

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් ;

(ආ) නියාමන මණ්ඩලය විසින් පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයෙහි අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමෙන් පසු එකී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නේ නම් ; සහ

(ඇ) අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද සාත්තු සේවය, ආයුර්වේදී ඖෂධ නිකුත් කිරීම, ආයුර්වේදී උපස්ථානය, ආයුර්වේදී සම්බාහන ප්‍රතිකර්මය යන වෘත්තියයන්හි කාර්යක්ෂමව නියුක්ත වීමෙහිලා ප්‍රමාණවත් දැනුම හා පලපුරුද්ද ඇති අයෙකු බවට නියාමන මණ්ඩලය සෑහීමට පත් කරන්නේ නම් ද,

මිස, ආයුර්වේද සේවා නියුක්තිකයකු වශයෙන් ලියාපදිංචිවීමට හිමිකම නොලබන්නේය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා හේතු

25. යම් ආයුර්වේද සේවා නියුක්තිකයකු එවැනි සේවා නියුක්තිකයකුගේ තත්ත්වයෙන් යම් නොමනා හැසිරීමක් පිළිබඳව වරදකරුබව සොයාගත් අවස්ථාවක නියාමන මණ්ඩලය විසින් එකී සේවා නියුක්තිය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කොට ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හෝ එවැනි ලියාපදිංචිකිරීමක් අවලංගු කිරීම හෝ යම් නිශ්චිත කාලයකට අත් හිටුවීම හෝ කල හැකිවන්නේය.

ලියාපදිංචි වූ ආයුර්වේද සේවා නියුක්තිකයන්ට වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇතිබව

26. ලියාපදිංචිවනු ලැබූ සෑම ආයුර්වේදී සේවා නියුක්තිකයකුටම එකී සේවා නියුක්තියා මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිවනු ලැබුවේ යම් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්ද, එකී ක්ෂේත්‍රයෙහි දකුණු පළාත් සභාව ඇතුළත වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති අතර, තම සේවාව සඳහා ගාස්තු අයකරගැනීමටද ඔහුට හිමිකම ඇත්තේය.

ලියාපදිංචි නොවූ ආයුර්වේද සේවා නියුක්තිකයකු සේවයේ නියුතු කිරීම වරදක් බව

27. (1) කිසිම තැනැත්තකු විසින්, යම් තැනැත්තකු අවස්ථාවෝචිත පරිදි ආයුර්වේදී ඖෂධ නිකුත්කරන්නෙකු, ආයුර්වේදී උපස්ථායකවරයකු හෝ ආයුර්වේදී සම්බාහකවරයෙකු ලෙස තම කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා මේ ප්‍රඥප්තිය යටතේ විධිමත් ලෙස ලියාපදිංචි වී සහ අවසරගෙන ඇත්නම් මිස ආයුර්වේද සේවා නියුක්තකයකු ලෙස කර්තව්‍යන් ඉටුකිරීම සඳහා ආයුර්වේද ආයතනයක සේවයේ නියුක්ත කරනු නොලැබිය යුතුය.

(2) ආයුර්වේද ආයතනයක යම් ලියාපදිංචි අයිතිකරුවකු විසින් එකී ආයුර්වේද ආයතනයේ සේවයේ නියුතු සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නම් සෑම තුන් මසකටම වරක් නියාමන මණ්ඩලයට දැනුම්දිය යුතුය. එකී තොරතුරු නියමිත ආකෘතියට සාරානුකූලව ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වැනි උපවගන්තියේ හෝ (2) වැනි උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන කවර හෝ තැනැත්තකු විසින් වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝුනඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට හෝ මාස 12 ක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

ආයුර්වේදී සේවා නියුක්තිකයකු ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටීම වරදක් බව

28. (1) යම් තැනැත්තකු ආයුර්වේදී ඖෂධ නිකුත්කරන්නෙකු, ආයුර්වේදී උපස්ථායකවරයෙකු, හෝ ආයුර්වේදී සම්බාහකවරයකු, හෝ වශයෙන් මේ ප්‍රඥප්තියේ මේ කොටස යටතේ ලියාපදිංචි නොවී, අවස්ථාවෝචිත පරිදි,

(අ) ආයුර්වේදී ඖෂධ නිකුත් කරන්නා, ආයුර්වේදී උපස්ථාකවරයා, ආයුර්වේදී සම්බාහකවරයා යන පදවි නාමයන් ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඊට සමාන වෙනත් භාෂාවකින් තනිව හෝ වෙනත් වචන හෝ අක්ෂර හෝ සමග හෝ භාවිතා කිරීම ; හෝ

(ආ) තමා ලියාපදිංචි ආයුර්වේදී ඖෂධ නිකුත් කරන්නෙකු, ලියාපදිංචි ආයුර්වේදී උපස්ථායකවරයකු, හෝ ලියාපදිංචි ආයුර්වේදී සම්බාහකවරයෙකු ලෙස ව්‍යාංගිකව හැඟවෙන යම් නාමයක්, පදවිනාමයක්, එකතුකිරීමක් හෝ විස්තරයක් භාවිතා කිරීම ; හෝ

(ඇ) ආයුර්වේදී ඖෂධ නිකුත්කරන්නෙකු ලෙස, ආයුර්වේදී උපස්ථායකවරයකු ලෙස, හෝ ආයුර්වේදී සම්බාහකවරයෙකු ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටිමින් තම වාසිය තකා වෘත්තියෙහි නියැලීම හෝ ප්‍රතිකර්ම ලබාදීම හෝ සිදු කරන,

යම් තැනැත්තකු වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී, රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

29. (1) කිසිම තැනැත්තකු විසින්, ඒ සඳහා අවස්ථාවෝචිත පරිදි පළාත් කොමසාරිස්වරයාගේ හෝ නියාමන මණ්ඩලයේ හෝ ලිඛිත අවසරය ලබා ඇත්තේ නම් මිස ආයුර්වේද යන පදය භාවිත නොකල යුතු ය. "ආයුර්වේද " යන පදය භාවිත කිරීම.

(2) (1) වැනි උපවගන්තියේ කාර්ය සඳහා, "ආයුර්වේද යන පදය භාවිතා කිරීම" යන්නට -

(අ) යම් පදවිනාමයකට හෝ නාමයකට පෙර ;
(ආ) නාම පුවරුවක් මත හෝ සංඥා පුවරුවක් මත ;
(ඇ) විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍යයක් හරහා පෙන්නුම්කරන යම් වානිජ ප්‍රචාරක දැන්වීමක ; හෝ
(ඈ) යම් දැන්වීමක, නාමපුවරුවක, විස්තර පත්‍රිකාවක හෝ පත්‍රිකාවක ;

එකී පදය භාවිතා කිරීම හෝ හැඳින්වීම ඇතුළත් වේ.

(3) මේ වගන්තියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරනු ලබන අතර මහෙස්ත්‍රාත් අධිකරණයක් මගින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

30. (1) පළාත් අමාත්‍යවරයා විසින් නියාමන මණ්ඩලය විමසා පහත දැක්වෙන සියල්ල හෝ ඉන් කිසිවක් හෝ සඳහා නියෝග සෑදීම කළ හැකිවන්නේ ය. නියෝග

(අ) යම් තැනැත්තකු නම් ආයුර්වේදී සේවා නියුක්තිකයකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා උපයෝගී කරගත යුතු පටිපාටිය;

(ආ) යම් තැනැත්තකු මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ආයුර්වේදී සේවා නියුක්තිකයකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ;

(ඇ) මේ ප්‍රඥප්තියේ මේ කොටස යටතේ ලියාපදිංචි වූ යම් ආයුර්වේදී සේවා නියුක්තිකයකු විසින් අනුගමනය කළ යුතු හැසිරීම් පද්ධතිය, රීති සහ කොන්දේසි ;

(ඈ) අදාළ ඉල්ලුම්පත්‍රවල ආකෘති සහ ඒවායේ අන්තර්ගතවිය යුතු කරුණු ;

(ඉ) යම් තැනැත්තකු ආයුර්වේදී සේවා නියුක්තිකයකු වශයෙන් ලියාපදිංචි කිරීම සහ ඒ සඳහා දෙනු ලබන අවසරය බල පැවැත්වෙන කාල පරිච්ඡේදය ;

(ඊ) එකී ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි අවස්ථාවන් ;

(උ) එකී ලියාපදිංචි කිරීම අලුත් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථාවන් ; සහ

(ඌ) එසේ ලියාපදිංචි කිරීම සඳහා වූ හෝ ලියාපදිංචි කිරීම අලුත් කිරීම සඳහා හෝ වූ ඉල්ලුම් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ එම ලියාපදිංචි කිරීම අවලංගු කිරීමට හෝ විරුද්ධව අමාත්‍යවරයාට ඉදිරිපත් කරනු ලබන අභියාචනා.

(2) (1) වැනි උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, එය ප්‍රසිද්ධ කරනු ලබන දින දී හෝ නියෝග වල දක්වනු ලැබිය හැකි පසු දිනයකදී හෝ සිට ක්‍රියාත්මක විය යුතුය.

(3) (1) වැනි උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් එය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිදි එකී අනුමතයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය.

X වැනි කොටස

සාමාන්‍ය

ආයුර්වේද ආයතනවලට අදාළ වැරදි

31. මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් යම් ආයුර්වේද ආයතනයකට හෝ ඊට අදාළව හෝ සිදුකරනු ලබන අවස්ථාවක, එකී වරද සිදුකරනු ලැබූ තැනැත්තාට විරුද්ධව එකී වරද සම්බන්ධයෙන් සිදුකරනු ලබන යම් නීති කෘත්‍යයකට අගතියක් නොවන පරිදි, එකී ආයුර්වේද ආයතනයේ අයිතිකරු හෝ එකී ආයතනයේ සන්තකය දරන්නා හෝ ලෙස තත්කාලයේ ලියාපදිංචි තැනැත්තාද, තත්කාලයේ එකී ආයතනය භාරව සිටින තැනැත්තාද යන එක් එක් තැනැත්තා, එකී වරද සිදුකරනු ලැබුවේ තමාගේ දැනුම නොමැතිව බව හෝ එකී වරද සිදුකිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කල බව හෝ ඔහු ඔප්පු කරන්නේ නම් මිස, එකී වරදට වරදකරු විය යුතුය.

විවිධ වැරදි

32. (1) (අ) මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියෝග යටතේ තම බලතල ක්‍රියාත්මක කරනු ලබන තැනැත්තෙකුට යම් යුක්ති සහගත හේතුවක් නොමැතිව බාධා කරන ;

(ආ) මේ ප්‍රඥප්තියේ අධිකාරය යටතේ ක්‍රියාකරන පුද්ගලයෙකු වශයෙන් මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කරන අතරතුර හෝ ඉටු කරන අතරතුර, අන් අයට පීඩාකාරී ආකාරයෙන් හෝ අන් අය ප්‍රකෝප කරවන ආකාරයෙන් හැසිරෙන හෝ ක්‍රියාකරන ;

(ඇ) මේ ප්‍රඥප්තිය අධිකාරය යටතේ ක්‍රියාකරන පුද්ගලයෙකු වශයෙන් මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කරන විට හෝ තම කර්තව්‍ය ඉටු කරන විට ඒ හා සම්බන්ධව තමාට ලැබුණු යම් තොරතුරක්, එකී තොරතුරු හෙළිකිරීම සඳහා මේ ප්‍රඥප්තිය මගින් අවසර දී ඇති කාර්යය හැර, වෙනත් කාර්යයක් සඳහා යම් තැනැත්තෙකුට හෙළි කරන ;

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ තමන්හට පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව ක්‍රියාකරමින් ඉදිරිපත් කල යුතු යම් වාර්තාවක් හෝ යම් තොරතුරක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන හෝ තමන් විසින් ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක් මගින් හෝ තොරතුරක් මගින් දැන දැනම යම් ව්‍යාජ ප්‍රකාශයක් කරන ; හෝ

(ඉ) මේ ප්‍රඥප්තියේ හෝ එය යටතේ සාදනු ලබන යම් නියෝගයක හෝ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන හෝ, මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් යටතේ තමන්ට දෙනු ලබන යම් විධානයක් පිළිපැදීමට අපොහොසත්වන,

සෑම තැනැත්තෙකුම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ දඬුවමක් ප්‍රකාශිතව සලසා නොමැති යම් වරදක් සිදුකරන ලබන සෑම තැනැත්තෙකුම, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කිරීමේ දී, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් යම් පුද්ගල මණ්ඩලයක් විසින් සිදුකරනු ලබන විටෙක -

(අ) එකී පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එකී සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙකුම සහ අදාළ නිලධරයෙකුම ;
(ආ) එකී පුද්ගල මණ්ඩලය වෙළඳ ව්‍යාපාරයක් නම් එකී වෙළඳ ව්‍යාපාරයේ සෑම හවුල්කරුවෙකුම

එකී වරද සඳහා වරදකරුවෙකු ලෙස සැලකිය යුතු ය.

එසේ වුව ද, එකී අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ එකී වෙළඳ ව්‍යාපාරයේ හවුල්කරු හෝ විසින් එකී වරද සිදු කරන ලද්දේ තම දැනුම නොමැතිව බව හෝ එකී වරද සිදුකිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්‍යෝගයෙන් ක්‍රියාකල බව හෝ ඔප්පු කරන්නේ නම්, ඔහු එකී වරද සඳහා වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

(4) පළාත් කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය ලැබූ යම් නිලධරයකු හෝ සේවකයෙකු, මේ ප්‍රඥප්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු කටයුතු කිරීමේ කාර්යය සඳහා, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව රජයේ නිලධරයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය.

V වැනි කොටස

අර්ථ නිරූපනය

අර්ථ නිරූපනය

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"ආයුර්වේද' යන්නට, ආයුර්වේදය, සිද්ධ, යුනානි සහ ශ්‍රී ලංකාවට ආවේනික පාරම්පරික වෛද්‍ය ක්‍රමය යම් විදේශීය රටවලට ආවේනික වූ, සහ පිළිවෙලින් එකී විදේශීය රටවල නීති මගින් පිළිගනු ලැබුවාවූ වෙනත් වෛද්‍ය ක්‍රමද වෙනත් යම් ස්වාභාවික, සමාන්තර, පෙරදිග, හෝ මනාපිත ප්‍රතිකාර ක්‍රම හෝ රෝග වැළැක්වීමේ ක්‍රම හෝ ප්‍රතිශක්තිකරණ ක්‍රම හෝ සමාන අර්ථයක් ඇති වෙනත් සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රමද ඇතුළත් වේ. ආයුර්වේදී යන පදයද මේ අනුව තේරුම් ගත යුතු ය.

"ආයුර්වේදී උපස්ථායකවරයා" යන්නෙන්, මේ ප්‍රඥප්තිය යටතේ ආයුර්වේදී උපස්ථායකවරයෙකු ලෙස ලියාපපදිංචි වූ තැනැත්තෙකු අදහස් වේ ;

"ආයුර්වේදී ඖෂධ නිකුත් කරන්නා" යන්නෙන්, මේ ප්‍රඥප්තිය යටතේ ආයුර්වේදී ඖෂධ නිකුත්කරන්නෙකු ලෙස ලියාපදිංචි වූ තැනැත්තෙකු අදහස් වේ ;

"ආයුර්වේදී විවේක නිකේතන" යන්නෙන් ස්වභාවික පාරිසරික සෞන්දර්යය හා මුසුව සම්බාහනය, ඖෂධීය තෛල ආලේපනය, ශාකසාර ස්නාන, සුවඳ කවන ලද තෙල, සුවඳකැවූ ධූමයන් සහ ආහාර පාලනයද මගින් සෞඛ්‍ය, රූපලාවන්‍ය සුරැකීම, සහ ශාරීරික සහ මානසික සුවතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසුයැයි එකී ආයතනය විසින් හුවාදක්වනු ලබන ක්‍රම එකක් හෝ වැඩි ගණනක් උපයෝගී කරගනිමින් ආයුර්වේදී වෛද්‍ය ක්‍රමය හා එකඟව උපදෙස්, පුහුණුව සහ සේවා සපයන යම් ආයතනයක් අදහස් වේ.

"ආයුර්වේදී රෝහල" යන්නෙන්, යම් රෝගයකින් හෝ අබලතාවයකින් පෙළෙන තැනැත්තන් පිළිගැනීම, ඔවුන්ට සාත්තු කිරීම, සහ ප්‍රතිකාර කිරීමද සඳහා භාවිතා කරනු ලබන හෝ භාවිත කිරීම සඳහා අපේක්ෂා කරනු ලබන (කවරාකාරයෙන් හෝ විස්තර කරනු ලබන) යම් පරිශ්‍රයන් අදහස්වන අතර ආයුර්වේදී සාත්තු නිවාසයක් හෝ ආයුර්වේදී මාතෘ නිවාසයක් ද ඊට ඇතුළත් වන නමුදු, ආයුර්වේදී සත්කාර මධ්‍යස්ථානයක් ඊට ඇතුළත් නොවේ.

"ආයුර්වේදී සම්බාහකවරයා" යන්නෙන්, මේ ප්‍රඥප්තිය යටතේ ආයුර්වේදී සම්බාහකවරයෙකු වශයෙන් ලියාපදිංචි වූ තැනැත්තෙකු අදහස් වේ.

"ආයුර්වේදී ඔසුහල" යන්නෙන්, ආයුර්වේදී ඖෂධ නිෂ්පාදනයේ දී භාවිතා කරනු ලබන අමු හෝ වියළි ද්‍රව්‍ය, ඖෂධ පැළෑටි හෝ ඒවායේ කොටස් සහ රෝග විනිශ්චය කිරීම සඳහා සහ එකී රෝගවලට ප්‍රතිකාර කිරීම, සුවකිරීම, වැළැක්වීම, අවම කිරීම හෝ පාලනය කිරීම ද සඳහා භාවිතා කරනු ලබන උපකරණ, මෙවලම් සහ ශල්‍ය වෛද්‍ය උපකරණ ද විකිණීම, විකිණීම සඳහා අර්පනය කිරීම සහ ආනයනය කිරීම සහ අපනයනය කිරීම යන එකක් හෝ ඊට වැඩි ගණනක කර්තව්‍ය ඉටුකිරීමට අදාළව භාවිතා කරනු ලබන ස්ථානයක් අදහස් වේ.

"ආයුර්වේදී ඖෂධවේදියා" යන්නෙන්, ප්‍රඥප්තිය යටතේ ආයුර්වේදී ඖෂධවේදියෙකු ලෙස ලියාපදිංචි වූ තැනැත්තෙකු අදහස් වේ.

"ආයුර්වේදී සත්කාර මධ්‍යස්ථානය හෝ බෙහෙත් ශාලාව" යන්නෙන්, ආයුර්වේදී වෛද්‍ය ක්‍රමයට අදාළව යම් තැනැත්තෙකු පරීක්ෂාකිරීම, එකී තැනැත්තාට උපදෙස් දීම, ප්‍රතිකාර ක්‍රම නියම කිරීම හෝ ප්‍රතිකාර කිරීම ද සඳහා භාවිත කරනු ලබන හෝ භාවිත කිරීමට අපේක්ෂා කරනු ලබන යම් ස්ථානයක් අදහස් කරනු ලබන අතර, යම් ආයුර්වේදී ඔසුහලක් එයට ඇතුළත් නොවේ.

"ප්‍රධාන අමාත්‍යවරයා" යන්නෙන්, දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා අදහස් වේ.

"පළාත් අමාත්‍යවරයා" යන්නෙන්, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සහ ඊට සම්බන්ධිත කාරණා පිළිබඳ විෂයය භාරදෙනු ලැබූ දකුණු පළාත් සභාවේ පළාත් අමාත්‍යවරයා අදහස් වේ.

## උපලේඛනය

### *නියාමන මණ්ඩලයට අදාළවන්නා වූ විධිවිධාන*

1. මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය සහ කාර්ය ඉටුකිරීමේ දී, නියාමන මණ්ඩලය, පළාත් අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි යම් සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්විය යුතු ය.

නියාමන මණ්ඩලය පළාත් අමාත්‍යවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට යටත්විය යුතු බව.

2. (1) සලකා බැලීම සඳහා නියාමන මණ්ඩලය ඉදිරියට පමුණුවනු ලබන සෑම ප්‍රශ්නයක් සම්බන්ධයෙන්ම නියාමන මණ්ඩලයේ රැස්වීමක දී කටයුතු කල යුතු අතර, එකී ප්‍රශ්නය, පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගේ බහුතරය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

නියාමන මණ්ඩලයේ රැස්වීම්.

(2) නියාමන මණ්ඩලයේ යම් රැස්වීමක දී සලකා බලනු ලබන යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබුණු විටක එකී රැස්වීමේ සභාපතිවරයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) නියාමන මණ්ඩලයේ යම් රැස්වීමක දී සිදුකරනු ලබන ඕනෑම ක්‍රියාවක්, හෝ තීරණයක් එහි සාමාජිකයෙකුගේ තෝරාපත්වීම හෝ පත්කිරීම හෝ සම්බන්ධයෙන් දෝෂයක් තිබුනු බව හෝ එකී සාමාජිකයා සුදුසුකම් නොමැත්තෙකු

බව හෝ පසුව හෙළිවුවද එය නොතකා, එකී සෑම සාමාජිකයෙකුම විධිමත් ලෙස තෝරාපත් කරගනු ලැබූ ලෙස හෝ පත්කරනු ලැබූ ලෙස සහ එවැනි සාමාජිකයෙකු වීමට සුදුසුකම් ලැබුවකු හෝ ලෙසින් සලකා වලංගු විය යුතු ය.

(4) නියාමන මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් එකී මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක් අවලංගු නොවිය යුතු ය.

නිලබලයෙන් පත්කරනු ලබන සාමාජිකයන්.

3. නියාමන මණ්ඩලයේ සෑම නිලබලයෙන් පත්වූ සාමාජිකයකුම, එකී සාමාජිකයා නියාමන මණ්ඩලයට පත්කරනු ලැබූවේ යම් නිලයක් දැරීම ප්‍රකාරව ද, එකී නිලය දරන තාක් කල් නියාමන මණ්ඩලයේ ධුර දැරිය යුතුය.

පත්කළ සාමාජිකයන්ට අදාළ විධිවිධාන.

4. (1) නියාමන මණ්ඩලයේ සෑම පත්කළ සාමාජිකයෙකුම, ඔහු මියයාම, ඉල්ලා අස්වීම, හෝ ඉවත් කිරීම, හෝ හේතුවෙන් ධුරය අත්හැරියහොත් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, විනය කරුණු මත ඉවත් කළහොත් මිස නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙකු විය යුතු ය.

(2) ප්‍රධාන අමාත්‍යවරයා විසින්, පළාත් අමාත්‍යවරයා විමසා එය එසේ කිරීම සුදුසුයැයි සිතන්නේනම්, යම් පත්කළ සාමාජිකයෙකු *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයන් මගින් හේතු දක්වා ඉවත් කළ හැකි ය.

(3) යම් පත්කළ සාමාජිකයෙකුට කවර හෝ වේලාවක දී ඒ සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම එය ප්‍රධාන අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබීමෙන් පසු බලපැවැත්විය යුතු ය.

(4) යම් පත්කළ සාමාජිකයෙකුගේ මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම සිදුවූ අවස්ථාවක දී පළාත් අමාත්‍යවරයා විසින්, මේ ප්‍රඥප්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා වෙනත් තැනැත්තෙකු පත්කළ යුතු ය. එසේ පත්කරනු ලබන තැනැත්තා ඔහු විසින් අනුප්‍රාප්ත කරනු ලබන සාමාජිකයාගේ ඉතිරි ධුරකාලය සඳහා ධුර දැරිය යුතු ය.

(5) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හෝ වෙනත් යම් හේතුවක් හෝ නිසා යම් පත්කළ සාමාජිකයෙකුට තම ධුරයේ කටයුතු කිරීමට නොහැකිවන අවස්ථාවක දී පළාත් අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු පත්කළ යුතු ය.

මුද්‍රාව.

5. (1) නියාමන මණ්ඩලයේ මුද්‍රාව පළාත් අමාත්‍යවරයා විසින් නියාමන මණ්ඩලයේ එකඟත්වයෙන් යුතුව නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

(2) නියාමන මණ්ඩලයේ මුද්‍රාව -

(අ) නියාමන මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි වූ තැනැත්තෙකුගේ හෝ තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය.

(ආ) තමන් සිටි බවට සලකුණක් වශයෙන් සාධන පත්‍රයේ හෝ ලේඛනයේ තම අත්සන තැබිය යුතු නියාමන මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරියේ හැර කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයට නොතැබිය යුතු ය.

සාමාජිකයකු වීමට නුසුදුසුකම්.

6. යම් තැනැත්තකු -

(අ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු නම් හෝ එවැනි සභිකයෙකු වුවහොත්, ; හෝ

(ආ) දෙපාර්තමේන්තුව හෝ නියාමන මණ්ඩලය මගින් හෝ එවැන්නක් වෙනුවෙන් සිදුකරන ලද යම් ගිවිසුමක් හෝ යටතේ සෘජුව හෝ වක්‍රාකාරයෙන් යම් අයිතියක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්තිවිඳින්නේ නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකලවූවකු ලෙස හඳුනාගෙන තිබේ නම් හෝ එවැන්නෙකු ලෙස ප්‍රකාශයට පත්කොට ඇත්නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත්වූවකු ලෙස හෝ බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත්වූවකු හෝ බංකොලොත්භාවයට පත්වූවකු හෝ වන්නේ නම් ; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් යම් වරදකට වරදකරු කොට ඇත්නම්

එකී තැනැත්තා නියාමන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීමට හෝ එවැනි සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කිරීමට හෝ නුසුදුස්සෙකු විය යුතු ය.

7. නියාමන මණ්ඩලයේ සාමාජිකයන්ට එකී මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීම සඳහා, පළාත් අමාත්‍යවරයා විසින් මුදල් විෂයයභාර පළාත් අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන පරිදි වූ පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

රැස්වීම්වලට පැමිණීම සඳහා වූ පාරිශ්‍රමික.

8. (අ) නියාමන මණ්ඩලය විසින් මේ ප්‍රඥප්තිය යටතේ සද්භාවයෙන් කරනු ලබන හෝ කරනු ලැබීයයි උද්දේශිත යම් ක්‍රියා සම්බන්ධයෙන් නියාමන මණ්ඩලයට එරෙහිව ; හෝ

මේ ප්‍රඥප්තිය යටතේ හෝ නියාමන මණ්ඩලයේ විධානය යටතේ හෝ ගනු ලබන ක්‍රියා සඳහා ආරක්ෂාව.

(ආ) නියාමන මණ්ඩලයේ යම් සාමාජිකයෙකු නිලධරයෙකු, සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ නියාමන මණ්ඩලයේ විධානය යටතේ හෝ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරනු ලැබීයයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එකී සාමාජිකයාට, නිලධරයාට සේවකයාට හෝ අනුයෝජිතයාට එරෙහිව,

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරීම නොකළ යුතු ය.

9. නියාමන මණ්ඩලයට එරෙහිව ඉදිරිපත් කරනු ලැබූ යම් නඩුවක දී නියාමන මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ පුද්ගලයාට හෝ දේපළවලට හෝ එරෙහිව යම් රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

නියාමන මණ්ඩලයේ සාමාජිකයින්ට එරෙහිව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

නියාමන මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

10. නියාමන මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

11. (1) නියාමන මණ්ඩලය විසින්, පහත දැක්වෙන සියල්ල හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන්, එනම් -

රීති සෑදීමට නියාමන මණ්ඩලයට ඇති බලය.

(අ) මේ ප්‍රඥප්තියේ වෙනත් යම් විධිවිධානයන් යටතේ රීති සෑදිය යුතු යැයි අවශ්‍ය කරනු ලබන හෝ අවසර දෙනු ලබන කවර හෝ කරුණක් ;

(ආ) නියාමන මණ්ඩලයේ රැස්වීම් සහ එකී රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය ; සහ

(ඇ) නියාමන මණ්ඩලයේ කටයුතු හා සම්බන්ධ වෙනත් යම් කාරණා,

සම්බන්ධයෙන් රීති සෑදීම කළ හැකිවේ.

(2) මේ ප්‍රඥප්තිය යටතේ නියාමන මණ්ඩලය විසින් සාදනු ලබන යම් රීතියක් එය අමාත්‍යවරයා විසින් අනුමත කොට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන්නේ නම් මිස බලපෑමක් ඇති නොකළ යුතු ය.

06-463

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.